# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව.

# මාතර දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 02 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 03 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 සැප්තැම්බර් 09 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කරන ලද ශේෂ පිරික්සුමෙහි එකතුව තුල රු.72,236,488 ක් වූ ආදායම් සහ එකතුව රු.77,193,241 ක් වූ වියදම්ද අත්හැර තිබුණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසර ව්‍යාපෘතියෙන් පරිත්‍යාග වශයෙන් 2012 ඔක්තෝබර් 23 දින ලැබී තිබූ රු.1,479,000 ක් වටිනා අංක SPRD 1588 දරන කසල ප්‍රවාහනය කරන ට්‍රේලරයේ වටිනාකම ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික ආයතනයකින් මිළටගෙන තිබූ රු.175,644 ක් වටිනා අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව හිඟහිටි වෙනත් ආදායම් ගිණුමේ වටිනාකම රු.49,999,237 ක් වුවද ලෙජරයට අනුව වටිනාකම රු.72,783,319 ක් වූයෙන් රු.22,784,082 ක වෙනසක් විය.

1.3.2 නිරවුල් නොකළ ගිණුම්

(අ) ඉකුත් වර්ෂ ගණනාවක සිට පැවත එන රු.1,116,559 ක ණයහිමි ශේෂයයන් හා රු.1,184,540 ක් වූ ණයගැති ශේෂයයන් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම හා ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම පිළිවෙලින් රු.66,399 හා රු.47,271,801 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.134,560,960 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.598,225 ක් වූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 797,709 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් බදු | 754 | 546 | 106 |
| (ii) | බදු කුලී | 1,749 | 1,834 | 91 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 379 | 410 | 50 |
| (iv) | වෙනත් ආදායම් | 18,697 | 7,302 | 49,999 |

2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ හිටි වරිපනම් බදු මුදල රු.280,070 ක් විය. 2006 වර්ෂයේ සිට වාර්ෂිකව හිඟහිටි බදු ප්‍රමාණයන් වැඩිවී තිබූ අතර 1987අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාර හිඟ බදු අයකර ගැනීමට සභා ලේකම්වරයා කටයුතු කර නොතිබුණි.

2.2.3 වෙනත් ආදායම්

සභාවට අයත් පොදු වෙළඳසැලින් හා මස්කඩ වෙළඳුන් සිව්දෙනෙකුගෙන් 1999 සිට 2009 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල හිඟහිටි රු.91,106 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ මුදල හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | රු. 133,333 |
| (ii) | මුද්දර ගාස්තු | රු. 881,308 |

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2.3.1 සභා බල ප්‍රදේශය තුල අනවසර ඉදිකිරීම් 51 ක් තිබූ බවට වාර්තා වී තිබූ අතර සභාව අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) හි (ඉ) සහ (උ) සහ 126 (ix) (ඉ) හි විධිවිධාන අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොතිබුණි.

2.3.2 සමාලෝචිත වර්ෂයේදී අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රයක් 2012 ජනවාරි 16 දින මිලදී ගැනීම සඳහා රු.175,644 ක්ද, විදුලිය සැපයීමේ උපාංග සඳහා රු.19,905 ක්ද ජල ටැංකි ඉදිකිරීම සඳහා රු.16,400 ක් වශයෙන් එකතුව රු.211,949 ක් වැයකර තිබුණද 2013 මැයි 27 දිනැති භෞතික පරීක්ෂණ අවස්ථාව වන විටද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

මෙම ව්‍යාපෘතිය යටතේ වියදම ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ ගිණුම් ගතවී නොතිබූ අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූයෙන් ඉලක්ක කර තිබූ රු.850,500 ක ආදායමද අහිමි වී තිබුණි.

2.3.3 රාජ්‍ය මුදල් අධ්‍යක්ෂක ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය පරිදි 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.3.4 සභාව විසින් සංයුක්ත සැලැස්මේ ඇතුළත් දෑ ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

2.4 වීථි පහන් නඩත්තු කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශයේ අනුමත වීථි පහන් සංඛ්‍යාව පහන් 91 ක් වුවද පහන් 1014 ක නඩත්තු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වීථි පහන් හා උපකරණ, නඩත්තුකරුට වැටුප් යනාදිය සඳහා රු.354,975 ක මුදලක් වැයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වීථි පහන් නඩත්තු කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත බැඳීමක් ඇතිකරගෙන නොතිබූ අතර නඩත්තු සඳහා එම මණ්ඩලයෙන් ලැබිය යුතු රු.29,158 ක මුදල 2013 මැයි 26 දින වන විටද ලැබී නොතිබුණි.

(ඇ) විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 හා අංක පීඊ/01/01 දරන චක්‍රලේඛ ලිපියේ 1.4 ඡේදය පරිදි සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීම සිදුව නොතිබූ අතර පහන් සවිකිරීමේදී වීථි පහන්වල විදුලි බල පරිභෝජනය අදාල ප්‍රදේශයේ ගෘහස්ථ හා පොදු කාර්ය සිල්ලර පාරිභෝජනයෙන් සියයට 3 කට සීමා විය යුතු වුවද සභාව ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

2.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

2012 වර්ෂයේදී ගෘහස්ථ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා කොම්පෝස්ට් බැරල් 50 ක් මිළදී ගැනීම සඳහා රු.145,100 ක් වැයකර තිබූ අතර රු.42,000 ක් වටිනා බැරල් 15 ක 2013 මැයි මාසය වන විටද බෙදාදීමකින් තොරව සභා භූමියේ ගොඩගසා තිබුණි. බෙදාදුන් බැරල් වලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයක් සිදුවේද යන්න පිළිබඳව පසු විපරම් කිරීමක් සිදුව නොතිබුණි.

2.6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක | 01 | 01 |
| ද්විතියික | 11 | 12 |
| තෘතියික | 09 | 09 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 04 | 17 |
| | 25 | 39 |

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.6,213,000 ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂයේ වැටුප් වියදම රු.9,162,579 ක වූයෙන් සභා අරමුදලට රු.2,949,574 ක අතිරේක වැය බරක් ඇති වී තිබුණි.

(ඇ) 2002 ජනවාරි 03 දිනැති අංක 14 හා 2006 අප්‍රේල් 10 උනැති අංක 28 කළමනාකරණ සේවා චක්‍රලේඛ මගින් පළාත් පාලන ආයතනවල අනියම්, ආදේශක හා කොන්ත්‍රාත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවා ඇතත් එකී විධිවිධාන වලට පටහැනිව සේවකයින් 08 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් වශයෙන් සභා අරමුදලින් රු. 1,186,041 ක මුදලක් ගෙවා තිබුණි. මෙම චක්‍රලේඛ උපදෙස් අභිබවා යමින් බඳවා ගැනීම් සිදුකළහොත් ආයතන ප්‍රධානියා ඒ සඳහා පුද්ගලිකව වගකීමෙන් බැඳී සිටින බවද එහි අවධාරණය කර තිබුණි.

3. පද්ධති හා පාලන

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) වත්කම් කළමනාකරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ගිණුම්කරණය